// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2369/42 - 2024 පෙබරවාරි මස 02 වැනි සිකුරාදා - 2024.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත

2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනතේ 3 වන වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින් මෙම නියමය මඟින් 2024 ජනවාරි මස 12 දිනැති අංක 2366/33 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මඟින් සංශෝධිත පරිදි, 2022 අගෝස්තු මස 31 දිනැති අංක 2295/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2022 අංක 1 දරන කැසිනෝ ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබාදීමේ නියෝග එහි දෙවන උපලේඛනය වෙනුවට මෙහි සඳහන් උපලේඛනය ආදේශ කිරීම මඟින්, සංශෝධනය කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 පෙබරවාරි මස 02 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

## '' II වන උපලේඛනය

| | නිරීක්ෂණය | | කැසිනෝ බලපත්‍ර ගාස්තු | කැසිනෝ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු |
|---|---|---|---|---|
| 1 | ඇමරිකානු ඩොලර් මිලියන තිහකට (ඇ. ඩො. මි. 30) නොඅඩු නමුත් ඇමරිකානු ඩොලර් මිලියන සියයකට (ඇ. ඩො. මි. 100) නොවැඩි සෘජු ආයෝජනයක් කැසිනෝහි ආයෝජනය කරනු ලබන ඉල්ලුම්කරුවකු, සහ | අ) අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන දෙසිය පනහක (ඇ. ඩො. මි. 250) අවම ඒකාබද්ධිත සංවර්ධනයක්* සඳහා ආයෝජනය කරනු ලබන ; හෝ | රුපියල් බිලියන දහයක් | රුපියල් බිලියන දහයක් |
| | | ආ) අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන දෙසිය පනහක (ඇ. ඩො. මි. 250) අවම ආයෝජනයක් කරන ලද ඒකාබද්ධිත සංවර්ධනයක්* තුළ ක්‍රියාත්මක කරනු ලබන | | |
| 2 | ඇමරිකානු ඩොලර් මිලියන සියයකට (ඇ. ඩො. මි. 100) නොඅඩු සෘජු ආයෝජනයක් කැසිනෝහි ආයෝජනය කරනු ලබන ඉල්ලුම්කරුවකු, සහ | අ) අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන පන්සියයක (ඇ. ඩො. මි. 500) අවම ඒකාබද්ධිත සංවර්ධනයක්* සඳහා ආයෝජනය කරනු ලබන ; හෝ | රුපියල් බිලියන පහක් | රුපියල් බිලියන දහයක් |
| | | ආ) අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන පන්සියයක (ඇ. ඩො. මි. 500) අවම ආයෝජනයක් කරන ලද ඒකාබද්ධිත සංවර්ධනයක්* තුළ ක්‍රියාත්මක කරනු ලබන | | |
| 3 | 2023 ජනවාරි මස 01 දිනට පෙර බලපත්‍ර ලබාගත් දැනට ක්‍රියාත්මක වන කැසිනෝ ක්‍රියාකරුවන් | | රුපියල් බිලියන දෙකක්<br><br>(පළමු වසර පහ සඳහා- රුපියල් මිලියන පන්සියයයි ;<br><br>ඊළඟ වසර පහළොව සඳහා- රුපියල් බිලියන එකයි මිලියන පන්සියයයි) | රුපියල් බිලියන දහයක් |

* ඒකාබද්ධ සංවර්ධනයක් යනු හෝටල්, කැසිනෝ, විනෝදාස්වාද, සිල්ලර වෙළඳාම්, අවන්හල් ආදී විවිධාංගීකරණ ඇතුළත් විවේකය ලබාදෙන දේපළකි. ''

EOG 02 - 0108

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.